**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2016**

-----------------------------------------------------------------------

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ 10(ඇ) (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උපචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඇණවුම් කරන ලද නමුත් මුදල් නොගෙවන ලද වටිනාකම රු. 4,082,996 ක්වූ ලී බඩු, පරිගණක උපාංග හා කාර්යාල උපකරණ 2016 දෙසැම්බර් 31 දින වනවිටත් සභාව වෙත ලැබී නොතිබියදී ස්ථාවර වත්කම් හා ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) තොග සමීක්ෂණ වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ තොග වටිනාකම රු. 2,117,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. 1,319,100 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ අවසාන තොග ශේෂය රු. 797,900 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුද්‍රණ වියදම රු. 793,429 කින් සහ වර්ෂ අවසාන උපචිත වියදම් ගිණුමේ ශේෂය රු. 2,253,277 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට උපචිත පර්යේෂණ වියදම් ගිණුම රු. 562,960 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සේවක පාරිතෝෂික වෙන් කිරීමේ දී සේවා කාලය නිවැරදිව ගණනය නොකිරීම නිසා සේවකයන් 21 දෙනෙකු වෙනුවෙන් රු. 356,257 ක මුදලක් වැඩියෙන් වෙන්කර තිබුණි.

(ඊ) පිරිවැය නිශ්චය නොකළ වර්ග 20 කට අයත් පොත් හා ප්‍රකාශන 11,218 ක තොගය අගයකර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර තිබුණු ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුව වත්කම් මිලදීගත් දිනය පදනම් කරගෙන ක්ෂය කරන බව දක්වා තිබුණද වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම් 15 ක් මිලදීගත් දින පදනම් කරගෙන ක්ෂය නොකිරීම හේතුවෙන් වාර්ෂික ක්ෂය රු. 1,321,721 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ශේෂය, ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු. 4,082,996 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පරිවර්තිත සංචිත (Translation Reserve) ගිණුමේ ශේෂය රු. 229,124 ක් වුවද ලෙජරයට අනුව එම ශේෂය රු. 1,146,753 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන හා ලෙජරය අතර රු. 917,629 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත සඳහන් ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ණයහිමියෝ | 7,175,841 | උපලේඛන හා කාල විශ්ලේෂණය |
| ණයගැතියෝ | 304,695 | |
| ගෙවිය යුතු වෙනත් වියදම් | 3,427,229 | කාලවිශ්ලේෂණ |
| වෙනත් ආයතන වලින් ලැබිය යුතු මුදල් | 2,988,766 | |
| කාර්යය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් | 444,679 | |
| උපචිත වියදම්, පෙර වර්ෂ ගැලපුම් ගිණුම් ශේෂ යනාදිය සඳහා වූ ජර්නල් වවුචර් | 14,241,296 | ජර්නල් සටහන් තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි හා විස්තර |
| එකතුව | 28,582,506 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී පැවැත් වූ "අනාගතය ස්පර්ශ කරමු" (Touch Your Future) වැඩසටහන වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගත යුතු රු.1,123,118 ක් 2017 අප්‍රේල් 17 දින දක්වාම ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) සේවක ණය ශේෂය තුළ 2006 හා 2010 වර්ෂවල දී සේවයෙන් පහ කරන ලද සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 115,183 ක් අයකර ගැනීමට ප්‍රවර්තන වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත III වන පරිච්ඡේදය | |
| (i) 14 (I) වගන්තිය | පනත යටතේ ලියාපදිංචි නොකර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලැස්වීම සඳහා කිසිදු ආයතනයක් පිහිටුවීම, කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම හෝ පාලනය කිරීම නොකළ යුතු වුවද දිවයින තුළ පවත්වාගෙන යන එබඳු බොහෝ වෙනත් අධ්‍යාපන ආයතන එම පනත යටතේ ලියාපදිංචි කර නොතිබුණි. 2014 වර්ෂයේ දී ආයතනය විසින් කරන ලද පර්යේෂණයකට අනුව සමස්ථ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන ආයතන සංඛ්‍යාව 2,701 ක් වූ අතර කොමිෂන් සභාව ලියාපදිංචි කරගත් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 1080 හෙවත් සියයට 40 ක් පමණ විය. 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 692 දක්වා අඩු වී තිබුණි. |
| (ii) 15 (I) වගන්තිය | පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතනවල පවත්වනු ලබන තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා වන පාඨමාලා, කොමිෂන් සභාවේ ලියාපදිංචි කළ යුතු වුවද 2014 වර්ෂයේ දී කරන ලද පර්යේෂණයකට අනුව සමස්ථ පාඨමාලා 9768 න් ජාතික නිපුණතා සුදුසුකම් මට්ටම් සඳහා ලියාපදිංචි කරගෙන තිබූ පාඨමාලා සංඛ්‍යාව 2,442 ක් වූ අතර එය සියයට 25 ක් පමණක් විය. 2017 ඔක්තෝබර් 01 දින වන විට ලියාපදිංචි පාඨමාලා සංඛ්‍යාව 1625 දක්වා අඩු වී තිබුණි.<br><br>සියලු පුහුණු ආයතන හා පාඨමාලා ලියාපදිංචි කරගැනීමේ ක්‍රම වේදයක් ආයතනය විසින් අනුගමනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188 (2) | බැංකුවේ තැන්පත් කළ නමුත් නියමිත කාල සීමාව තුල උපලබ්ධි නොවූ රු.51,155 ක් වටිනා චෙක්පත් 14 ක් විගණන දිනය වූ 2017 අප්‍රේල් 30 වන විට මාස 7 සිට මාස 17 ක් දක්වා කාලයක් ගතව තිබුණද ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2016 දෙසැම්බර් 31 දිනට නිකුත් කර බැංකුවට ඉදිරිපත් නොවූ මාස 6 සිට අවුරුදු 2 මාස 5 ක් දක්වා කාලයක් ඉකුත් වී තිබූ රු. 161,499 ක් වටිනා චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි නියමයන් පරිදි කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවලින් රු. 15,982 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,947,804 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,931,822 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් පිළිවෙලින් රු. 11,253,233 කින් හා රු.25,403,602 කින් වැඩිවුවද රජයේ ප්‍රදාන හා ව්‍යාපෘති ප්‍රදාන රු. 38,098,393 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අතිරික්තයන් පැවති නමුත් 2015 වර්ෂය හා 2016 වර්ෂයේ දී ඌනතාවයන් නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමේ දී 2012 වර්ෂයේ දී රු.41,489,597 ක් වූ දායකත්වය 2013 වර්ෂයේ දී රු. 39,198,869ක් දක්වා අඩුවුවද නැවත 2014 වර්ෂයේ සිට අඛණ්ඩ වැඩිවීමක් සිදුවී තිබූ අතර 2016 වර්ෂය දී එය රු. 71,844,533 ක් දක්වා වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය, ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම හා සියළු තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතනවල පුහුණු සම්මතයන් පවත්වාගෙන යාම ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණු විය. එම අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනතේ II පරිච්ඡේදයේ 11(4) වගන්තිය පරිදි ප්‍රාදේශීය වශයෙන් සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවය දක්වා තිබුණද 2017 ජුනි 30 දින දක්වාම බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන සැලසුමක් සකස් කර නොතිබුණි. තවද අනෙකුත් පළාත් සඳහා සකස් කර තිබූ සැලසුම් අනුව එම පළාත්වල පුහුණු කටයුතු සිදු කරන බවට පසුවිපරම් කිරීම, සම්බන්ධීකරණය හෝ සංවර්ධනයන් හා සැලසුම් යාවත්කාලීන කිරීම කොමිෂන් සභාව විසින් සිදුකර නොතිබුණි.

(ආ) ජාතික වශයෙන් පිළිගත් සහතික පත්‍ර පිරිනැමීම සඳහා ක්‍රමයක් ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ප්‍රදාන ක්‍රමය හඳුන්වා දී තිබූ අතර කොමිෂන් සභාව විසින් පනත පරිදි එම ක්‍රමය අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම වෙනුවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ආයතනය තුළ නොතිබියදී ඇගයීම්කරුවන් පත්කිරීමේ හා ගෙවීම් කිරීමේ කටයුතු කොමිෂන් සභාව විසින්ම සිදුකිරීම නිසා ඇගයීම්කරුවන් පත්කිරීම , ඇගයීම් කිරීම, ඇගයීම්කරුවන්ට ගෙවීම් කිරීම හා එම සහතික නිකුත් කිරීම යන සියලු පියවරයන්හිදී ප්‍රමාදයන් සිදු වී තිබුණි.

(ඇ) පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති, පුහුණු ආයතන හා පුහුණුවන්නන් විසින් පිළිපදින බව ආයතනික පරීක්ෂාව තුළින් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් කොමිෂන් සභාව සතු නොවුවද පනතේ 50 සහ 51 වගන්ති මගින් එම කටයුතු ඉටු කිරීම සඳහා මෙම පනත යටතේම සංස්ථාපිත ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට පරීක්ෂකවරුන් බඳවාගෙන තිබුණද ඔවුන් ලවා හෝ එම පරීක්ෂණ කටයුතු සිදු කරවා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව යටතේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන 400 ක් අලුතින් ලියාපදිංචිය සඳහා ඇගයීමට හා ආයතන 370 ක් ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඇගයීමට ඉලක්ක කළද, සත්‍ය වශයෙන්ම පිළිවෙළින් ආයතන 259 ක් හා ආයතන 339 ක් පමණක් ඇගයීමට ලක්කර තිබුණි.

(ඉ) කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය අංශයේ පාඨමාලා 503 ක් හා පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල පාඨමාලා 108 ක් ජාතික පුහුණු මට්ටම් අනුව ප්‍රතීතනය සඳහා ඇගයීමට ලක් කර තිබුණද අදාළ නිර්ණායක සපුරා තිබූ පාඨමාලා 392 ක් පමණක් ප්‍රතීතනය කර තිබුණි. ප්‍රතීතනය අලුත් කිරීම සඳහා රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන සංවිධානවල පාඨමාලා 259 ක් පමණක් ඇගයීම් කර එයින් පාඨමාලා 177 ක ප්‍රතීතනය අලුත් කර තිබුණි.

(ඊ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ඉලක්ක අනුව නිපුණතා සභාවල ව්‍යාපාර සැලැස්ම (Business Plan) ප්‍රකාරව එම සභා විසින් මුල් වර්ෂයේ සිට ආදායම් ඉපයීම් සිදු කළ යුතු වුවත් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ඒ වෙනුවෙන් රු.14,201,077 ක් වැයකර තිබුණි.

(උ) නිපුණතා අංශය සඳහා ක්‍රියාත්මක නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය විසින් හඳුනාගත් ව්‍යාපෘති කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 79 ක් වෙන් කර තිබුණි. වර්ෂය තුළ දී එයින් රු. මිලියන 34.25 ක් වැයකර තිබූ නමුත් ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාසල් හැරයන්නන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම සඳහා අත්පොත් සකස් කර නොතිබුණි.

(ii) කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ශ්‍රම වෙළඳපොල තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා රු. මිලියන 8.5 ක් වෙන්කර තිබුණ ද අදාල කාර්යයන් ප්‍රමාණවත්ව ඉටු නොකිරීම නිසා එයින් සියයට 88 ක් ඉතිරිකර තිබුණි.

(iii) ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත්ව තිබූ ලාංකිකයන් රැකියාගත කර ඇති විදේශ ආයතන 10 ක බලධාරීන් සමඟ සම්බන්ධ වී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් ජාත්‍යන්තර තත්ත්වය හා සමාන බව තහවුරු කර ගැනීම, වෘත්තීය පුහුණු අංශයේ පුහුණු කටයුතු හා ශිෂ්‍යයින්ගේ කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සංවර්ධනය සහ මූලික පාදක සමීක්ෂණය (Baseline survey) හා නිපුණතා පරතර සමීක්ෂණය (Skill Gap Survey) පදනම් කරගෙන නිර්දේශ හා යෝජනා නිකුත් කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(iv) වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා ලිංග ප්‍රතිපත්තියක් (Gender Policy) සකස් කිරීම සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා වෘත්තීයමය ප්‍රවර්ධන වැඩපිළිවෙළක් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

(ඌ) පනතේ 37 (ආ) වගන්තිය පරිදි නිපුණතා සම්මත සකස් කිරීමේ වගකීම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය වෙත පැවරී තිබුණු අතර ඒවා වලංගු කිරීම කොමිෂන් සභාව විසින් කළ යුතු වේ. එහෙත් 2016 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් ද නව නිපුණතා සම්මත 14 ක් සකස් කර තිබුණු අතර ඒවා සම්මත ක්‍රමවේද අනුව කර්මාන්තයේ සහභාගීත්වය ලබාගෙන සකස් කර නොතිබුණි.

(එ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 1 සිට 7 දක්වා හඳුනාගෙන තිබුණ ද, 2016 වර්ෂයේ දී ප්‍රතීතනය වූ සියලු වෘත්තීය ආයතන වෙනුවෙන් ප්‍රදානය කළ ඉහළම සහතික ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 මට්ටමේ සහතික බව කාර්යසාධන වාර්තා අනුව නිරීක්ෂණය විය. එහෙත් එම මට්ටම සඳහා සහතිකපත් 06 ක් පමණක් නිකුත් කර තිබූ අතර ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම සඳහා නිකුත් කර තිබුණේ සහතික 87 ක් පමණි. මේ අනුව ජාතික වෘත්තීය සුදුසුකම්වලින් ඉහළ මට්ටම්වල සුදුස්සන් බිහිවීම අඩු මට්ටමක පවත්නා බව නිරීක්ෂණය වේ.

(ඒ) රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රතීතන මට්ටමට ගෙන ඒමේ අරමුණින් අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට මූල්‍යාධාර සැපයීමේ වැඩපිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ නමුත් ඒ සඳහා ආයතන තෝරා ගැනීමට පිළිගත හැකි නිර්ණායක තීරණය කර නොතිබුණි. තවද රාජ්‍ය අංශයේ පුහුණු මධ්‍යස්ථාන, මූල්‍යාධාර ලබාදීම සඳහා 2016 වර්ෂයේ දී තෝරාගෙන නොතිබුණු අතර පෞද්ගලික අංශයේ මධ්‍යස්ථාන 03 ක පාඨමාලා 04 කට රු. 856,835 ක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, තෝරා ගැනීමේ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2016 වර්ෂය තුළ කිසිදු ආයතනයකට මුදල් ප්‍රතිපූරණය කිරීමට නොහැකි වී තිබූ අතර 2017 මාර්තු 30 වන විටත් ප්‍රතිපූරණය නොකළ මුදල රු. 336,910 ක් විය. තවද, 2012 සිට 2016 දක්වා වර්ෂවල රු. 3,565,280 ක් වූ මූල්‍යාධාර ලබාදෙන ලද මධ්‍යස්ථාන 20 කට අයත් පාඨමාලා සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අරමුණුගත පරිදි ප්‍රතීතනය කරගෙන නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ අනුමත වෘත්තීය පුහුණු ආයතනවල ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය පිණිස නිපුණතා පාදක ඇගයීම් කටයුතු සඳහා ඇගයීම්කරුවන් පත්කිරීම සහ එම ඇගයීම් සඳහා ගෙවීම් කිරීම, 2013 වර්ෂයේ සිට මෙම ආයතනය වෙත පැවරී තිබූ නමුත් 2016 වර්ෂය අවසානය දක්වාම ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු කර ඉල්ලුම පරිදි ප්‍රමාණවත් පුද්ගලයින් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසානය දක්වා බඳවාගෙන තිබූ මුළු ඇගයීම්කරුවන් සංඛ්‍යාව 2,165 ක් වූවද, එම ඇගයීම්කරුවන් ක්‍රියාකාරී සේවයේ යෙදෙන බවට තහවුරු කර ගැනීම සඳහා කාලානුරූපීව එම තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි.

(ii) 2017 පෙබරවාරි 20 දින වන විට ජාතික නිපුණතා මට්ටම් ප්‍රදානය සඳහා පරීක්ෂණ පැවැත්වීමට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පාඨමාලා 42 වෙනුවෙන් ඇගයීම්කරුවන් පත් කිරීම සඳහා ඉල්ලුම් කර මාස 02 සිට මාස 13 දක්වා කාලයක් ගතව තිබිය දී කොමිෂන් සභාව විසින් එම පත්කිරීම් සිදුකර නොතිබුණි.

(iii) 2017 පෙබරවාරි 20 දින වන විට ජාතික නිපුණතා මට්ටම් ප්‍රදානය සඳහා පරීක්ෂණ පැවැත්වීමට ඇගයීම්කරුවන් පත්කර මාස 03 සිට මාස 12 දක්වා ගතවී තිබුණ ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ ඇගයීම් කටයුතු අවස්ථා 111 කදී සිදුකර නොතිබුණි.

(iv) අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 වර්ෂය තුළ ඇගයීම්කරුවන් වෙත ගෙවීම සඳහා වෙන්කළ මුදල රු. මිලියන 14.45 ක් වුවද කාර්යසාධන වාර්තා අනුව රු. මිලියන 24.271 ක් ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ ගිණුම් කටයුතු සඳහා භාවිතා කරන ලද තිබස් පරිගණක ගිණුම්කරණ පද්ධතිය 2017 මැයි මාසයේ සිට ක්‍රියා විරහිත වීම නිසා ඇතුළත් කර තිබූ දත්ත සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. කොමිෂන් සභාව විසින් පරිගණකයෙන් පිටත දත්ත ගබඩා කර තබා ගැනීම සඳහා වූ පිළිගත් ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කර නොතිබූ නිසා විනාශ වූ දත්ත පද්ධතිය 2017 අගෝස්තු 31 දින තෙක් යථා තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. තවද මේ සම්බන්ධ පරීක්ෂණයක් සිදු කොට දත්ත පද්ධතිය විනාශවීමට හේතු හා ඊට සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු සිදු කර නොතිබුණි. දත්ත පද්ධතිය විනාශවීමේ ප්‍රතිඵලයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට විගණන කටයුතු සඳහා ඉදිරිපත් කළ යුතු ණයහිමි හා ගෙවියයුතු වියදම් වලට අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි විය.

## 4.3 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------

අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ 8 වන මහල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පරිහරණය සඳහා සකස් කිරීමට 2016 නොවැම්බර් 24 දින, මාසයක කොන්ත්‍රාත් කාලයකට යටත්ව රු. 6,575,375ක වටිනාකමට කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි. එහෙත් ඇස්තමේන්තුව තුළ එම මහලට අවශ්‍ය ජල, වැසිකිළි ආදී පහසුකම් ලබා දීම ඇතුළත් කර නොතිබූ නිසා 2017 මැයි 31 දින වන විටද එම මහල පරිහරණය සඳහා යොදාගත නොහැකිව තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 116 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 96 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 20 ක්ව පැවති අතර අත්‍යාවශ්‍ය තනතුරක් වන පරිපාලන නිලධාරී තනතුරද එම පුරප්පාඩු තුල පැවතුණි.

(ආ) බඳවා ගැනීමේ පරිපාටියේ 4.1.1 වගන්තිය අනුව කළමනාකරණ සේවා මට්ටමේ තනතුරු සඳහා ඉල්ලුම් කරන අභ්‍යන්තර අයදුම් කරුවන් කනිෂ්ඨ කළමණාකරණ සේවා මට්ටමෙහි I ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළයුතු වුවද එලෙස සේවා පලපුරුද්ද සම්පූර්ණ නොකළ අභ්‍යන්තර නිළධාරීන් හය දෙනෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවාගෙන තිබුණි. තවද අමතර සුදුසුකම් හා පලපුරුද්ද වෙනුවෙන් එක් එක් පුද්ගලයාට පෞද්ගලික වන සේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී තිබුණි.

## 4.5 අරමුදල් උපයෝජනය

----------------------------

විවිධ කාර්යයන් සඳහා ව්‍යාපෘති තුනකින් ලැබී ඉතිරිව තිබූ රු. 3,155,817 ක විදේශ ආධාර මුදල් භාවිතා කිරීම සඳහා විධිමත් සැලැස්මක් නොමැතිව ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

--------------------

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 05 ක් වූ නමුත් එයින් සහකාර අධ්‍යක්ෂ_තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ප්‍රමාණවත් පරිදි විගණන කටයුතු සිදු කිරීමට බාධාවක් වී තිබුණි. තවද නිපුනතා ආංශික සංවර්ධන ව්‍යාපෘති වියදම් විගණනය කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම්,තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 25 සිට සියයට 149 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | 2016 මැයි මාසයේ දී පරිගණකගත ගිණුම් පද්ධතිය ක්‍රියා විරහිතව තිබූ අතර විධිමත් පරිදි දත්ත පිටත ගබඩා කර නොතිබීම (Back up) නිසා පරිගණක දත්ත විනාශ වී තිබීම, දත්ත පද්ධතිය නැවත යථා තත්ත්වයට පත්කර නොතිබීම, දත්ත පද්ධතිය විනාශ වීම සම්බන්ධව පරීක්ෂණ පවත්වා ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා නොගැනීම. |
| (ආ) | මූල්‍ය පාලනය | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් වෘත්තීය පුහුණු අංශයේ නියාමන කටයුතු වෙනුවෙන් ආයතනය වෙත ආධාර ලබා දී තිබුණ ද ඒවා උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | මානව සම්පත් පරිපාලනය | ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවය තක්සේරු කිරීම, බඳවා ගැනීම හා ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම. |
| (ඈ) | වවුචර් සම්බන්ධ අභ්‍යන්තර පාලනය | විගණනය සඳහා වවුචර් ඉදිරිපත් කිරීමේදී හිඟ වවුචර් සහිතව ඉදිරිපත් කර තිබූ අතර වගකිව යුතු නිලධාරියකු විසින් පරීක්ෂා කර නොතිබීම, වවුචර් ආරක්ෂා කර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබීම. |